**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

## අවසාන විභාගය - 2014 ජූලි
## (60) උසස් මූල්‍ය ගිණුම්කරණය

පසුගිය විභාග පිළිතුරු පත්‍ර ඇගයීමේදී පරීක්ෂකවරුන් විසින් හඳුනාගත් අයදුම්කරුවන් විසින් පොදුවේ සිදුකරන ලද වැරදි හා දුර්වලතාවයන් සමහරක් මෙවර විභාගයෙන් අසමත් වූ අයදුම්කරුවන්ට ඉදිරියේදී පත්වන්නා වූ විභාගවලින් ජයග්‍රහණය අත්කර ගැනීමට පහසු වනු පිණිස ඉදිරිපත් කරන්නෙමු.

**ප්‍රශ්න අංක 1 : මුළු ලකුණු 30**

පළමු ප්‍රශ්නයේ මූලික අරමුණ වූයේ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පොදු සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමයි.

විෂය නිර්දේශයේ සියළු කොටස් ආවරණය වන පරිදි මෙම ප්‍රශ්නය සකසා ඇත.

**යෝජිත පිලිතුරු සඳහා පිවිසුම**

වයිට් ෆලවර් පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රශ්නයේ දී ඇති (a) සිට (d) දක්වා වූ කොටස් සඳහා පිළිතුරු සැපයීමේදි මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට දී ඇති සියළුම ගැළපිලි නිසි පරිදි ගැළපුම් කළ යුතු වේ.

**ලකුණු දීමේ පිළිවෙල**

| | | |
|---|---|---|
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම | ලකුණු | 12 |
| මූල්‍ය තත්ත්ව විස්තරය පිළියෙල කීරීම | ලකුණු | 10 |
| ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙල කිරීම | ලකුණු | 03 |
| දේපළ පිරියත උපකරණ සඳහා සටහන | ලකුණු | 05 |
| මුළු ලකුණු | | 30 |

විභාග පරීක්ෂකයන්ට අනුව මේ ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් වෙන් කළ මුළු ලකුණු ප්‍රමාණයෙන් සැළකිය යුතු ලකුණු සංඛ්‍යාවක් ලබා ගැනීමට සමත් විය. මෙයින් පෙනී යන්නේ අයදුම්කරුවන්ට තමා තුළ වූ න්‍යායාත්මක දැනුම දී ඇති ප්‍රායෝගික අවස්ථාවක් සඳහා සාර්ථකව භාවිතා කිරීමට ඇති හැකියාව වේ. පරීක්ෂකවරුන් විසින් ප්‍රශ්න පත්‍ර ඇගයීමේදී කළ නිරීක්ෂණ පහතින් දක්වා ඇත.

**ගැළපුම 01 - ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව**

මෙම ගැලපුම සිදුකිරීමට 50 ට වඩා වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් විසින් උත්සාහ දරා තිබුණි. නමුත් බහුතරයක් අයදුම්කරවන් මුළු ලකුණු සංඛ්‍යාවම ලබා ගැනීමට නොහැකි විය.

බහුතරයක් අයදුම්කරුවන් වසර අග තොගය වූ රු. 225,000/- නිවැරදි ලෙස පහළට ගෙනයන ශේෂය ලෙස කොන්ත්‍රාත් ගිණුමේ සටහන් නොකිරීම නිසා කොන්ත්‍රාත් පිරිවැය වැරදි අගයක් ගණනය කිරීමේදී ලැබී ඇත.

මෙලෙස කොන්ත්‍රාත් පිරිවැය වැරදි අගයක් ගැනීම නිසා 2014 මාර්තු 31 දිනට කොන්ත්‍රාත්තු නිමකළ වැඩවල ප්‍රතිශතය වැරදි ලෙස ගණනය කිරීම නිසා කොන්ත්‍රාත්තුවේ ආදායම ද වැරදි පිළිතුරක් ලැබී ඇත. කෙසේ වෙතත් ඉතා අතලොස්සක අයදුම්කරුවන් පිරිසක් කොන්ත්‍රාත් ආදායම නිවැරදි ලෙස ගණනය කිරීමට සමත් වී තිබුණි.

**ගැළපුම් 02 - කල්බදු වාරිකය**

කල්බදු ණයහිමියන්ගේ අගය ජංගම වගකීමක් හා දිගුකාලීන වගකීමක් ලෙස කොටස් වශයෙන් බෙදා දැක්වීමේදී සම්පූර්ණයෙන් වැරදි ලෙස ගණනය කර තිබුණි. තවද, කල්බදු ණය පොලීය ගණනය කිරීමේදී සමහර අයදුම්කරුවන් වැරදි සිදුකර තිබුණි. සමහර අයදුම්කරුවන් වර්තමානයේ භාවිතා කරන ගිණුම් ප්‍රමිත වෙනුවට පැරණි ගිණුම් ප්‍රමිත වලට අනුකූලව මෙම කල්බදු ගැළපුම සිදුකර තිබුණි.

**ගැළපුම් 03 - දේපළ පිරියත**

කාර්යාල උපකරණ ක්ෂය ගණනය කිරීමේදී නියමිත කාලය නිර්ණය කර ගැනීමට සමහර අයදුම්කරුවන්ට අපොහොසත් වීම නිසා ක්ෂය අගය වැරදි ලෙස ගණනය කර තිබුණි. රු. 200,000/- වටිනා කාර්යාල උපකරණ ඉවත් කිරීම බහුතරයක් අයදුම්කරවන් විසින් ගිණුම්වලට සටහන් කිරීමට අමතක කර තිබුණි. අයදුම්කරුවන් වැඩි පිරිසක් නිවැරදි ලෙස වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය ගණනය කර තිබුණද කල්බදු වත්කම් වලට අදාළ ක්ෂය ප්‍රමාණය පිළිබඳව සැළකිල්ලට ලක්කර නොතිබුණි.

**ගැළපුම් 05 - ආදයම් බදු වෙන් කිරීම.**

ආදායම් බදු ගැළපුම් බහුතරයක් අයදුම්කරවන් විසින් සාර්ථකව ගැළපුම්කර තිබුණි.

**ගැළපුම් 06 - ණය පියවීම**

බැංකු ණයෙන් 50% ප්‍රමාණයක් ඉදිරි වර්ෂය තුළ පියවිය යුතු බව ප්‍රශ්නයේ පැහැදිලිව සඳහන්කර තිබුනද බහුතරයක් අයදුම්කරුවන් බැංකු ණය ප්‍රමාණය නිවැරදිව දිගුකාලින වගකීම් හා ජංගම වගකීම් අතර බෙදා වෙන්කර පෙන්වා නොතිබිණි. තවද, බැංකු ණය පොලිය නිවැරදි ලෙස ගණනය කර තිබුණේ අතලොස්සක් වූ අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණි.

**ගැළපුම් 08 - ලාභාංශ**

ගෙවිය යුතු වරණීය ලාභාංශය වූ රු. 250,000/- ප්‍රමාණය වෙන් කිරීමත් ලෙස වගකීම් යටතේ පෙන්වා නොතිබිණි. සමහර අයදුම්කරුවන් ගෙවිය යුතු වරණීය ලාභාංශ අගය නිවැරදිව හඳුනාගත්තද එය මූල්‍ය වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනවා වෙනුවට ස්කන්ධ ප්‍රකාශනයට ඇතුළත් කර තිබිණි.

සමහර අයදුම්කරුවන් සාමාන්‍ය කොටස සඳහා ලාභාංශ ගෙවීම ස්කන්ධ ප්‍රකාශනයේ රඳවාගත් ලාභය යටතේ පෙන්වනවා වෙනුවට සාමාන්‍ය කොටසක් යටතේ පෙන්වා තිබිණි.

බහුතරයක් අයදුම්කරුවන් සාමාන්‍ය කොටස් සඳහා වු අවසාන ලාභාංශ කොටසකට රු.1.50 මූල්‍ය ප්‍රකාශනවලට සටහනක් ලෙස පෙන්වා නොතිබිණි.

**පොදු මතය**

- සමහර අයදුම්කරුවන් "විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය" වෙනුවට "ලාභාලාභ ගිණුම" ලෙසත් "මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය වෙනුවට "ශේෂ පත්‍රය" ලෙසත් සඳහන් කර තිබිණි.
- සමහර අයදුම්කරුවන් වර්තමාන ගිණුම් ප්‍රමිත වලට අනුකූල වූ නියමිත ආකෘතීන් අනුගමනය කර නොතිබිණි.
- සමහර අයදුම්කරවන්ට වත්කම්, වගකීම්, ආදායම්, වියදම් වෙන් කර හඳුනාගැනීමට වූ නොහැකියාව ඔවුන්ගේ පිළිතුරු වලින් නිරීක්ෂණය විය.

**පිළිතුරු සැපයීම වැඩිදියුණු කර ගැනීම සඳහා උපදෙස්**

- අයදුම්කරුවන් විසින් කොන්ත්‍රාත් ගිණුම් පිළියෙල කිරීම පිළිබඳව දැනුම ලබාගැනීම.
- අවශ්‍ය අවස්ථාවලදී ගිණුම්කරණ සටහන් ඉදිරිපත් කිරීම.
- අවසාන පිළිතුර සඳහා ළඟා වූ ආකාරය දැක්වෙන සේ, පෙර වැඩ ඉදිරිපත් කිරීම.

  උදා:- ක්ෂය ගණනය කිරීම සඳහා පෙරවැඩ සමහර වියදම් සඳහා ගැළපුම් සිදුකර අවසාන පිළිතුර ලබාගත් ආකාරය සඳහා පෙරවැඩ
- දේපළ පිරියත උපකරණ සටහනේ ආරම්භක ශේෂය, මිලදී ගැනීම, ඉවත් කිරීම හා ක්ෂය ගැළපුම් කිරීම් සහිතව ඉදිරියට ගෙන යන ශේෂය පැහැදිලිව වෙන් වෙන්ව පෙන්වීම.
- වත්කම් ඉවත් කිරීමේ ගිණුම්වලදී ලැබිය යුතු රක්ෂණ වන්දි හා විකිණීමෙන් ලද මුදල නිවැරදිව ගිණුම්ගත කර පෙන්වීම.

**ප්‍රශ්න - 02 (ලකුණු 15)**

මෙම ප්‍රශ්නයේ අරමුණ වූයේ පහත සඳහන් දෑ පරීක්ෂා කිරීමයි.

- හවුල්ව්‍යාපාර විසුරුවා හැරීම පිළිබඳව අයදුම්කරුවන් සතු දැනුම පරීක්ෂා කිරීම.
- උපලබ්ධි ගිණුම පිළියෙල කිරීම
- හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම පිළියෙල කිරීම
- හවුල්ව්‍යාපාරයේ මුදල් පොත සමඟ හවුල්ව්‍යාපාරය විසුරුවා හැරීම ගණුදෙනු සිදුවන ආකාරය ද සටහන් කිරීම.

**පරීක්ෂකවරුන් විසින් පිළිතුරු පත්‍ර ඇගයීමේදී පහත සඳහන් දෑ නිරීක්ෂණය කරන ලදී.**

- බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා නිවැරදිව පිළිතුරු සපයා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් විය.
- සමහර අයදුම්කරුවන් හවුල්ව්‍යාපාරය විසුරුවා හැරීම සඳහා වැරදි ක්‍රම අනුගමනය කර තිබුණි. ඉතා සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් (a) කොටස සඳහා නිවැරදිව පිළිතුරු සපයා තිබිණි.
- බොහෝමයක් අයදුම්කරුවන් හවුල් ව්‍යාපාර උපලබ්ධි ගිණුමේ අලාභය නිවැරදිව ගණනය කලත් හවුල්කරුවන් අතර ලාභලාභ බෙදීමේ අනුපාතයට නිවැරදිව බෙදා නොතිබණි.

- මුදල් පොත නිවැරදිව පිළියෙල කර තිබීම සෑහීමට පත්විය හැකිය.

- හවුල්කරුවන්ගේ ණය පියවීම නිවැරදිව ගිණුම්ගත නොතිබිණි. එය ගැළපුම්කළ යුතු වූයේ හවුල්කරුවන්ගේ ගිණුම්වලට වුවත් ප්‍රශ්නයෙන් හවුල්කරුවන්ගේ ණය ජංගම වගකීමක් පියවීමක් සේ සළකන ලෙස දන්වා තිබුණි. මෙම කරුණු බොහෝමයක් අයදුම්කරුවන් සැළකිල්ලට ලක් කර නොතිබිණි.

- සමහර අයදුම්කරුවන් ගණුදෙනු උපලබ්ධි ගිණුමේ වැරදි පැත්තට සටහන්කර තිබුණි. එනම් හර විය යුතු ගණුදෙනු බැර ලෙස සටහන් කිරීම වේ.

- වර්ෂය අවසානයේදි හවුල්කරුවන්ගේ ශේෂයන් ශූන්‍ය විය යුතු බව බහුතරයක් අයදුම්කරුවන් හඳුනාගෙන නොතිබිණි.

**ප්‍රශ්න අංක 03 (මුළු ලකුණු 15)**

මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂකතුමා බලාපොරොත්තු වූයේ හැමිල්ටන් පොදු සමාගමේ 2014 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමයි. ඒ අනුව,

i) ඒකාබද්ධ කිරිම මත කීර්තිනාමය ගණනය කිරීම.

ii) 2014 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම.

මෙම ප්‍රශ්නයෙන් අයදුම්කරුවන්ගේ ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමේ දැනුම පරීක්ෂාකර ඇත. මේ හා සමාන ප්‍රශ්න ගණනාවක් පසුගිය විභාගවලදී ද පරීක්ෂාවට ලක්කර ඇත.

**පිළිතුරු සැපයිය යුතු ක්‍රමය**

- අයදුම්කරුවන් විසින් වර්තමාන ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව ඒකාබද්ධ ගිණුම් පිළියෙල කර ඒකාබද්ධ වීම මත කීර්තිනාමය ගණනය කළ යුතුය.

- පරීක්ෂකතුමා විසින් අමතර විස්තර සැපයීමේදී හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ වටිනාකම පැහැදිලිව සඳහන් කර තිබූ අතර එය කීර්තිනාමය ගණනය කිරීමේදී එම වටිනාකම භාවිතා කළ යුතුය.

**පිළිතුරු සපයා ඇති ආකාරය**

- බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයේ කීර්තිනාමය ගණනය කිරීම කොටස හැර සෙසු කොටස් සඳහා සාර්ථක පිලිතුරු සපයා තිබුණි.

**අයදුම්කරුවන් විසින් පිළිතුරු සැපයීමේදී කර තිබූ පොදු වැරදි වලින් සමහරක් පහත දක්වා ඇත.**

- ශුද්ධ වත්කම්වල සාධාරණ වටිනාකම මත කීර්ති නාමය ගණනය කිරීමේ ක්‍රමය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ඉතා අඩුය.

- අන්තර් සමාගම් විකුණුම් නිවැරදිව ගැලපුමක් ඒ මත ඇති වූ උපලබ්ධි වූ ලාභය නිවැරදිව ගණනය කර නොතිබුණි. අවසාන පිළිතුරු වැරදි වුවත් එය ලබාගත් ආකාරය දක්වෙන පෙරවැඩ පරීක්ෂාකර නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදීම සිදුකළත් සමහර අයුදම්කරුන් පෙරවැඩ ඉදිරිපත් නොකිරීම නිසා එම අවස්ථාවද මඟහැරී තිබිණි.

- අතුරු ලාභාංශ ගැළපුම් කිරීමේදී අයදුම්කරුවන් විසින් වැරදි සිදුකර තිබිණි.
- කීර්තිනාමය ගණනය කළයුත්තේ පාලනය නොවන හිමිකම්වල සාධාරණ අගය මත පදනම්ව බව ප්‍රශ්නයේදී පැහැදිලිව සඳහා වුවද බොහෝමයක් අයදුම්කරුවන් ඉන් බැහැර වූ විවිධ ක්‍රම මත පදනම්ව ගණනය කිරීම් සිදුකර තිබිණි.
- ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව මග ඇති තොගයේ උපලබ්ධි ලාභය ගණනය කර තිබුණි. සමහරක් දෙනා එය පාලනය නොවන හිමිකමට ගලපා තිබුණි.

**ප්‍රශ්න අංක 04 මුළු ලකුණු 10**

රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන, රාජ්‍ය ගිණුම්කාරක සභාව, රාජ්‍ය භාණ්ඩාගාරයේ කාර්යයන් ආදිය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර ඇත. මෙම ප්‍රශ්නයන් නිශ්චිතව රාජ්‍ය මූල්‍ය ගිණුම්කරණය සම්බන්ධව අයදුම්කරුවන් තුළ වූ දැනුම පරීක්ෂාවට ලක්කර ඇත.

**පිළිතුරු සැපයිය යුතු ක්‍රමය**

අයදුම්කරුවන් විසින් රාජ්‍ය මූල්‍ය ගිණුම්කරණය සම්බන්ධ න්‍යායාත්මක කරුණු වලට අනුකූලව මේ සඳහා පිළිතුරු සැපයිය යුතු වේ.

**පිළිතුරු සපයා ඇති ආකාරය**

- බොහෝමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම් උත්සාහ කර නොතිබිණි.
- බහුතරයක් අයදුම්කරුවන් කොටස් තුන සඳහාම කිසිසේත්ම ප්‍රශ්නයට අදාළ නොවූ පිළිතුරු සපයා තිබිණි.
- රාජ්‍ය මූල්‍ය සම්බන්ධ විධිවිධාන දැක්වීමේදී විස්තරාත්මකව පිළිතුරු සැපයීම අවශ්‍ය වූ අතර අදාළ ඡේදය උපුටා දක්වමින් පිළිතුරු සැපයීමෙන් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට හැකිවිය.
- සමහර අයදුම්කරුවන් විසින් COPA හි කාර්යයන් වෙනුවට COPE හි කාර්යයන් දක්වා තිබිණි.
- ප්‍රශ්නයේ (C) කොටසේ අසා ඇති රාජ්‍ය භාණ්ඩාගාරයේ කාර්යයන් වෙනුවට බොහෝමයක් අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් සඳහන් කර තිබිණි.

**ප්‍රශ්න අංක 05 මුළු ලකුණු 15**

මෙම ප්‍රශ්නයේත් පරීක්ෂකතුමා විසින් බලාපොරොත්තු වූයේ බ්ලැක්බෝල්ට් පොදු සමාගමේ ගිණුම්කරණ අනුපාතයක් ගණනය කර එම අනුපාත පදනම් කරගෙන සමාගමේ මූල්‍ය තත්ත්වයන් පිළිබඳව කළමනාකරණයට උපදෙස් දෙමින් වාර්තාවක් කෙටුම්පත් කිරීමයි.

**පිළිතුරු සැපයීය යුතු ක්‍රමවේදය**

- අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අනුපාත ගණනය හා විශ්ලේශනය කිරීමේ දැනුම භාවිතාකර ගණනය කිරීම් සිදුකර ඒ මත පදනම්ව වාර්ථාව සකස් කළ යුතු වේ.

**පිළිතුරු සපයා තිබූ ආකාරය පිළිබඳ පොදු මතය**

- බහුතරයක් අයුදම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා සාර්ථකව පිළිතුරු සපයා තිබිණි. අයදුම්කරුවන් විසින් සිදුකරන ලද පොදු වැරදි වලින් සමහරක් පහත දක්වා ඇත.
- සමහර අයදුම්කරුවන් අනුපාතය ගණනය කිරීමේදී හරය හා ලවය ලෙස ගත යුතු නිර්ණයකයන් එකිනෙකට මාරුකර තිබීම නිසා වැරදි අගයන් පිළිතුරු ලෙස ලැබී තිබිණි.
- දළ ලාභ අනුපාතය ගණනය කිරීමේදී දළ ලාභය වෙනුවට විකුණුම් පිරිවැය ගණනය කිරීම් සඳහා ආදේශ කර තිබිණි.
- ජංගම අනුපාතය ගණනය කර තිබුණේ ප්‍රතිශතයක් ලෙසය.
- සමහර අයදුම්කරුවන් යෙදවූ මුළු ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය ගණනය කිරීමේදී වැරදි ලෙස ණය පොලී හා බදු ගැළපුම්කළ පසු ලාභය ගණනය කිරීමට ආදේශ කර තිබිණි.
- බොහෝමයක් අයදුම්කරුවන් විසින් වාර්තාව කෙටුම්පත් කිරීමේදී තමා විසින් ගණනය කළ අනුපාතයන් පදනම් කරගෙන විශ්ලේෂණ කර උපදෙස් ලබාදෙනවා වෙනුවට ඉන් බැහැරව කිසිදු පදනම නැතිව වාර්ථාව ඉදිරිපත් කර තිබිණි.
- තවත් සමහර අයදුම්කරුවන් ඔවුන් ගණනය කළ අනුපාතයන්ගේ ලැයිස්තුවක් පමණක් වාර්තාව ලෙස ඉදිරිපත් කර තිබිණි. ඔවුන් විසින් අනුපාතයක් වලින් ගම්‍යවන තත්වයන් විස්තර කිරීමක් තුළින් කළමනාකරණය වෙත උපදෙස් දීමක් සිදුකර නොතිබිණි.

**ප්‍රශ්න අංක 06 මුළු ලකුණු 15**

මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂකතුමා බලාපොරොත්තු වූයේ ඍජු ක්‍රමය මත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමයි.

මෙම ප්‍රශ්නයෙන් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අයදුම්කරුවන් සතු දැනුම පරීක්ෂාකර ඇත.

**යෝජිත පිළිතුරු සැපයීමේ ක්‍රමවේදය**

අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ 07 හි සඳහන් කරුණුවල අනුකූලව ඔවුන්ගේ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම භාවිතා කර මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයිමෙන් වැඩි ලකුණු ලබාගත හැකි විය.

**පිළිතුරු සැපයීම පිළිබඳ මතය**

- බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම උත්සාහ දරා තිබුණු අතර බහුතරයක් ගැළපුම් නිවැරදිව සිදුකරති.
- බොහෝමයක් අයදුම්කරුවන් ගැළපුම් සඳහා පෙර වැඩ ඉදිරිපත් කර තිබීම නිසා වැඩි ලකුණු ලබාගැනීමට සමත් විය.

**දුර්වල පිළිතුරු සඳහා හේතූන්**

- සමහර අයදුම්කරුවන් ණයකර නිදහස් කිරීම හා ණයපොලී ගණනය කිරීමේ ගැළපුම් සිදුකිරීමේදී ව්‍යාකූල තත්ත්වයක් පෙන්නුම් කර තිබිණි.
- මෙහෙයුම් වියදම් සඳහා මුදල් ගෙවීම් පිළිබඳව නිවැරදිව ගැළපුම් කිරීමට සමත් වූයේ අතලොස්සක් වූ අයදුම්කරුවන් පමණි. බහුතරයක් අයදුම්කරුවන් ක්ෂය අගය (මුදල් නොවන අයිතම) මෙහෙයුම් වියදම් ගණනය කිරීමේදී මුදල් ඉවතට ගලායාමේ ප්‍රවාහය ලෙස සළකා තිබිණි.
- ණය පොලී ගෙවීම නිවැරදිව ගණනය කර නොතිබිණි.
- බහුතරයක් අයදුම්කරුවන් විසින් ආදායම්/ වියදම් සහ ආරම්භක ශේෂයන් ලෙජර ගිණුම්වලට සටහන් කිරීමේදී ව්‍යාකූල බවක් පෙන්නුම්කර තිබිණි. උදාඃ- අයදුම්කරුවන් විසින් හර සහ බැර සටහන් නිවැරදිව සිදුකිරීමට අපොහොසත් වී තිබිණි.
- සමහර අයදුම්කරුවන්ට මුදලට විකුණුම් හා ගැණුම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුළත් කිරීමට අමතක වී තිබිණි. තවද මුදලට විකුණුම් හා ගැණුම් ගණනය කිරීමේදී වැරදි ප්‍රතිශතයක් ගණනය කිරීම් සඳහා යොදාගෙන තිබිණි.
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේදී සමහර අයදුම්කරුවන්ට සෘණ ලකුණු හෝ වරහන් යොදා අඩුකළ යුතු අගයන් පෙන්වීමට අමතක වී තිබිණි.
- බොහෝමයක් අයදුම්කරුවන් කොටස් නිකුත් කිරීම් වලින් ලද මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඇතුලත් කර තිබුණේ මුදල් බැහැර වීමේ ප්‍රවාහයක් ලෙසයි. තවද ණයකර නිදහස් කිරීමේදී ගෙවන ලද පොලිය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් බැහැර වීමේ ප්‍රවාහයක් ලෙස ඇතුළත් කර නොතිබිණි.
- සමහර අයදුම්කරුවන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැසඳීමේ සෘජු ක්‍රමයට අදාළ නිවැරදි ආකෘතිය අනුගමනය කර නොතිබිණි.
- සමහර අයදුම්කරුවන් මුදල් ප්‍රවාහයන්, මෙහෙයුම් ක්‍රියාවලියෙන් ලද ප්‍රවාහයන්, ආයෝජන ක්‍රියාවලියෙන් ලද මුදල් ප්‍රවාහ හා මූල්‍යමය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහයන් යන ලෙස ශීර්ෂයන් යටතේ වර්ග කර නොතිබිණි.
- සමහර අයදුම්කරුවන් වක්‍ර ක්‍රමය යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර තිබිණි.
- මෙහෙයුම් වියදම් ගණනය කිරීමේදී ක්ෂය ගැළපුම්කිරීම (මුදල් නොවන අයිතිම වසර ආරම්භයේ හා අවසානයේ පැවති හිඟ ශේෂයන් ගැළපුම් කිරීම සිදුකර නොතිබිණි.
- පොලිය ගණනය කිරීමේදි බහුතරයක් අයදුම්කරුවන් විසින් ණයකර සඳහා ගෙවන ලද අධිමිල අඩු කිරීමට අමතර කර තිබිණි. ඔවුන් විසින් සම්පූර්ණ මුදලට පොලී වියදම් ලෙස සළකා තිබුණි. මෙයින් පෙනීයන්නේ අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සැළකිල්ලකින් යුතුව කියවා නැති බවයි.

\- * * * -